සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது.
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

**06 ශ්‍රේණිය**

**නාට්‍ය හා රංග කලාව - I පත්‍රය**

කාලය පැය දෙකකි

නම / විභාග අංකයඃ-................................................................

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න
- අංක 1 සිට 5 දක්වා ප්‍රශ්නවලට නිවැරදි නම් ''✓'' ලකුණ ද වැරදි නම් ''×'' ලකුණ ද යොදන්න

(01) පරිකල්පනය යනු පැරණි මතකය අලුත් කිරීමයි ( )

(2) ගුවන් විදුලි නාට්‍ය ඇසීමෙන් රස විඳියි ( )

(3) රංගනයේදී මනස හා සිරුර අතර සබඳතාව අවශ්‍ය නොවේ ( )

(4) ජන කතාවක් කියවීමේදී උචිත වන්නේ ලිඛිත භාෂාවයි ( )

(5) නාට්‍ය ගීත ගායනයේදී මයික්‍රෆෝනය අත්‍යවශ්‍ය වේ ( )

- අංක 6 සිට 10 දක්වා ප්‍රශ්නවලට පහත වරහන තුළ ඇති වචන යොදා හිස්තැන් පුරවන්න

(අනුකරණය , ලේන්සු හැංගීම , ක්ෂණික නිරූපණ , නළුවරණය , මේවර කෙළිය)

(06) ජන ක්‍රීඩාවකි .................................

(07) පෙර සූදානමකින් තොරව කරනු ලබන නිරූපණ ......................................නම් වේ

(08) ''තැනතැන රවුමට ඉදගෙන'' ගීතය ඇසුරු කොටගෙන ඇත්තේ..........................................ජන ක්‍රීඩාවයි

(09) දකින දෙයක් ඒ අයුරින්ම කර පෙන්වීම........................................... යි

(10).......................................යනු නාට්‍ය සඳහා නළු නිළියන් තෝරා ගැනීමයි

- අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න

(11) නාට්‍යයක ලක්ෂණයක් නොවන්නේ

(1) පිටපතක් තිබීම (2) ප්‍රේක්ෂකයන් නැරඹීම

(3) කියවා රස විඳිය හැකිවීම (4) නළු නිළියන් රඟපෑම

(12) නළුවා සතු විය යුතු ගුණාංගයක් නොවන්නේ

(1) කැපවීම (2) ඉවසීම (3) පැහැපත් වීම (4) ගරු කිරීම

(13) ක්ෂණික නිරූපණ සඳහා යොදාගත හැකි මානුෂ හා අධිමානුෂ චරිත දෙකක් පිළිවෙලින් දැක්වෙන්නේ

(1) ගමරාළ හා ගමහාමිනේ (2) දෙවියන් හා ගමරාළ (3) දෙවියන් හා යක්ෂයා (4) ගමරාළ හා සුරඟන

(14) භූමිකා යනු

(1) චරිතයක තිබෙන විවිධ පැතිකඩ යි (2) විවිධ චරිත යි

(3) චරිත රංගනය යි (4) විවිධ හැගීම් ය

(15) අනුශාංගික කලාවන්ට අයත් නොවන්නේ

(1) රංග වස්ත්‍රාභරණ (2) අංග රචනය (3) නාට්‍ය උපකරණ (4) නාට්‍ය පිටපත

- අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට ගැලපෙන පිළිතුර තෝරා යා කරන්න.

| | |
|---|---|
| (16) ආලෙ බැන්ද මාගෙ රම්‍ය වන් | සිරිත් මල්දම |
| (17) කැත්තක් අරගෙන වත්තට යන කොට | පුංචි තිරය |
| (18) සංවාද හා චරිත | රබන් පද |
| (19) ගමන් කරපන් සිල්වතෙකු මෙන් | නාට්‍ය ගීත |
| (20) අඹ යාළුවෝ | නාට්‍ය පිටපත |

(ලකුණු 2×20=40)

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

**06 ශ්‍රේණිය**

**නාට්‍ය හා රංග කලාව - II පත්‍රය**

නම / විභාග අංකයඃ-................................................................

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ. පළමු ප්‍රශ්නය සමග 2,3,4,5,6 යන ප්‍රශ්නයන්ගෙන් ප්‍රශ්න දෙකක් තෝරාගෙන සියළු ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න

(01) පහත සංවාද ඛණ්ඩය ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න

මෙහෙ වරෙල්ලා දරුවනේ
මේ වී කරලත් ගෙනේ
මෝලට ගොස් කඩිනමේ
කොටා ගෙනෙල්ලා

(1) මෙම සංවාදය අයත් නාට්‍යය කුමක් ද? (ලකුණු 3)

(2) මෙම නාට්‍ය අධ්‍යක්ෂණය කලේ කවුරුන් ද? (ලකුණු 3)

(3) මෙම සංවාදය පවසන්නේ කවුරුන් විසින් කා හටද? (ලකුණු 4)

(4) මෙහිදී වී කරල කෙටීමට මෝලට යාමට ඉදිරිපත් වන්නේ කවුරුන් ද? (ලකුණු 3)

(5) වී කරල කොටා ගෙනවිත් සාදන කැවිලි වර්ගය කුමක් ද? (ලකුණු 3)

(6) මෙම නාට්‍යයෙන් පුංචි අපට ලබා ගත හැකි ආදර්ශ 2ක් ලියන්න (ලකුණු 4)

(02)

(1) සමාජයේ දැකිය හැකි විවිධ චරිත 5ක් නම් කරන්න (ලකුණු 5)

(2) එම චරිත හමුවිය හැකි ස්ථාන 5ක් සඳහන් කරන්න (ලකුණු 5)

(3) එම චරිත දෙකක් අතර සංවාදයක් ගොඩ නගන්න (ලකුණු 10)

(03)

(1) ඔබ දන්නා ජන ක්‍රීඩා 5ක් නම් කරන්න (ලකුණු 5)

(2) එම එක් ජන ක්‍රීඩාවක් සිදු කරන ආකාරය ලියා දක්වන්න (ලකුණු 7)

(3) එම ජන ක්‍රීඩාව සම්බන්ද ගීතයක කොටසක් ලියන්න (ලකුණු 8)

(04)

(1) ඔබ දන්නා ජන කතා තුනක් නම් කරන්න (ලකුණු 3)

(2) එම ජන කතාවේ ඔබ සිත්ගත් අවස්ථාවක් චිත්‍රයට නගන්න (ලකුණු 7)

(3) එම ජන කතාවේ ඔබ සිත්ගත් අවස්ථාවට ගැලපෙන කවියක් හෝ ගීතයක් නිර්මාණය කරන්න (ලකුණු 10)

(05) පහත සඳහන් චරිත කට්ටලයක් තෝරාගෙන ප්‍රමාණවත් දෙබසක් නිර්මාණය කරන්න

(1) සමනලයා සහ මල

(2) අම්මා සහ දුව

(3) වෙළෙන්දා සහ පාරිභෝගිකයා

(4) භික්ෂුව සහ උපාසකයා (ලකුණු 20)

(06) ඔබ දන්නා සම්පූර්ණ නාට්‍ය ගීතයක් ලියා එම ගීතය අයත් නාට්‍යයේ නම ගීතය ගයන චරිතය, ගීතය ගයන අවස්ථාව ලියන්න.

ගීය ලිවීමට - 5

නාට්‍යයේ නම ලිවීම - 5

ගීය ගයන චරිතය හෝ චරිත හැඳින්වීම -5 (ලකුණු 5×4=20)

ගීය ගයන අවස්ථාව ලිවීම - 5

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

06 ශ්‍රේණිය

නාට්‍ය හා රංග කලාව - පිළිතුරු පත්‍රය

### I පත්‍රය

| | | | |
|---|---|---|---|
| (01) × | (06) මේවර කෙළිය | (11) 3 | (16) නාට්‍ය ගීත |
| (02) ✓ | (07) ක්ෂණික නිරූපණ | (12) 3 | (17) රබන් පද |
| (03) × | (08) ලේන්සු හැංගීම | (13) 4 | (18) නාට්‍ය පිටපත |
| (04) × | (09) අනුකරණය | (14) 1 | (19) සිරිත් මල්දම |
| (05) × | (10) නළුවරණය | (15) 4 | (20) පුංචි තිරය |

(ලකුණු 2×20=40)

### II පත්‍රය

(01)

(1) පුංචි අපට දැන් තේරෙයි

(2) සෝමලතා සුභසිංහ

(3) කුකුල් හාමි විසින් මී පැටවුන්ට

(4) කුකුල් හාමි

(5) කැවුම්

(6) කම්මැලි නොවීම, හැකි පමණින් අන් අයට උදව් උපකාර කල යුතු වීම, සාමූහිකව වැඩ කටයුතු කල යුතුවීම, වැඩිහිටියන්ට කීකරු වීම

(02)

(1) භික්ෂුව , හිඟන්නා , වෙළෙන්දා , රියදුරා , පොලිස් නිළධාරියා ආදී චරිත ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න

(2) භික්ෂුව - පන්සල
හිඟන්නා - මහ පාර
වෙළෙන්දා - කඩය,පොළ
රියදුරා - බස්රථය

(3) චරිතයට අදාල සංවාද කොටසක් ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න

(03)

(1) පොරපොල් ගැසීම, චක්ගුඩු ගැසීම, එළුවන් කෑම, මේවර කෙළිය, ඔළිඳ කෙළිය

(2) කිසියම් ජන ක්‍රීඩාවක් සිදු කරන ආකාරය පිළිබඳ ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න

(3) තැන තැන රවුමට ඉදගෙන

එළුවන් කන්නයි මං ආවේ

මේවර කෙළිය

(04)

(1) ඕනෑම ජන කතා තුනක් නම් කර ඇත්නම් ලකුණු ලබා දෙන්න

(2) ඇඳ ඇති චිත්‍රයට අදාලව ලකුණු ලබා දෙන්න

(3) කවියට හෝ ගීතයට අදාලව ලකුණු ලබා දෙන්න

(05) ප්‍රමාණවත් දෙබසක් ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න

(06) සම්පූර්ණ නාට්‍ය ගීතයක් ලියා, නාට්‍යයේ නම ලියා ඇත්නම් සම්පූර්ණ ලකුණු ලබා දෙන්න